ලිංගික අතවරයන් සම්බන්ධ පුවත් වගකීම් සහගතව වාර්තා කරමු!

ලිංගික අතවරයන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී, එවැනි වරදක බරපතල භාවය පාඨකයාට ඒ අයුරින්ම ඉදිරිපත් කිරීම, එවැනි අපරාධ අවම කරගැනීම සඳහා සහයක් නොවනු ඇතිදැයි පාඨක අප විමසිය යුතු වේ. ලිංගික අතවරයන් සැහැල්ලු කොට වාර්තා කිරීම ඔස්සේ, ලිංගික අපරාධයන් සමාජය තුළ සාමාන්‍යකරණය වීමද සිදුවිය නොහැකි ද?

මෙයට නිදසුනක් ලෙස, විවිධ අතවර සිදුවීම් කිහිපයක්, දිනමිණ හා දිවයින පුවත්පත් තුළ (ජූලි 31, 2023) වාර්තා වී ඇති ආකාරය සැලකිල්ලට ගත හැක.

මෙම පුවත් වාර්තාවන් දෙකේම, සිරස්තල තුළ මේ සම්බන්ධයෙන් සඳහන් වී තිබුණේ, "කැත වැඩ" ලෙසින් දක්වමිනි. පුවත් අන්තර්ගතයන් තුළ, මෙම සිදුවීම් "ලිංගික අතවරයන්" හෝ "අතවරයන්" ලෙසින් සඳහන් වී තිබුණි.

ඔබ සිතන ලෙසට,

1) කාන්තාවකට සිදු වූ ලිංගික අතවරයක් හෝ අතවරයන්, "කැත වැඩක්" ලෙසින් සිරස්තල තුළ වාර්තා කිරීම වගකීම් සහගත වාර්තාකරණයක් ලෙසින් ගත හැකිද?

2) මෙවැනි සිරස්තල ඔස්සේ, ලිංගික අතවර වැනි වැරදි සම්බන්ධයෙන් සැහැල්ලු හැඟීමක් සමාජය තුළ ඇති වීමේ අවදානමක් නොමැති ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!